# වෙළඳ අමාත්‍යාංශය

# සමුපකාර තොග වෙළඳ සංස්ථාව

**සමුපකාර තොග වෙළඳ සංස්ථාවේ පහත සඳහන් තනතුර සඳහා සුදුසුකම් ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

## ගණකාධිකාරී තනතුර - 01

### බාහිර අයදුම්කරුවන්

**සුදුසුකම් :**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින්, ගණකාධිකාරී කළමනාකරණ වාණිජ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් තිබීම සහ

උපාධි සුදුසුකම් ලබාගැනීමෙන් පසු රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක, හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ වසර 03 ක පළපුරුද්ද.

### අභ්‍යන්තර අයදුම්කරුවන් :

අදාළ තනතුරට පැවරෙන විෂය ක්ෂේත්‍රයට අදාළ කනිෂ්ඨ කළමනාකාර (JM 1-1) සේවා ශ්‍රේණියේ II ශ්‍රේණියේ වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**පත්වීමේ ස්වභාවය :**

ස්ථිර, සේවක අර්ථ සාධක අරමුදල හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් සඳහා හිමිකම් සහිතය. බඳවාගනු ලබන්නේ MM 1-1 සේවා ශ්‍රේණියේ II ශ්‍රේණියට වනු ඇත.

**වැටුප් ක්‍රමය :**

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ 02/2016 අනුව,

MM 1-1 - 2016 - රු. 53,175 - 10x1,375 - 15x1,910 - 95,575/-

(මීට අමතරව රජය විසින් අනුමත රාජ්‍ය සංස්ථාවලට අදාළ දීමනා ගෙවනු ලැබේ)

**වයස :**

අවුරුදු 22 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපානු ඇත.

## ගිණුම් නිලධාරී තනතුර - 01

### බාහිර අයදුම්කරුවන් :

**අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් :**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ගණකාධිකරණය, කළමනාකරණය, වාණිජවේදී ක්ෂේත්‍රයේ උපාධියක් ලබා තිබීම.

**පළපුරුද්ද :**

උපාධි සුදුසුකම් ලබාගැනීමෙන් පසු රාජ්‍ය දෙපාර්තමේන්තුවක හෝ සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් වාණිජ අංශයේ ආයතනයක වසරක පළපුරුද්ද ලබා තිබීම.

### අභ්‍යන්තර අයදුම්කරුවන් :

අදාළ ක්ෂේත්‍රයේ තනතුරක "**කළමනාකරණ සහකාර**" සේවා ශ්‍රේණියේ II වන ශ්‍රේණියේ වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**පත්වීමේ ස්වභාවය :**

ස්ථිර, සේවක අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් සඳහා හිමිකම් සහිතය.

**වැටුප් ක්‍රමය :**

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ අනුව

JM 1-1 2016 රු. 42,600 - 10x755 - 18x1,135 - 70,580/-

මීට අමතරව රජය විසින් අනුමත රාජ්‍ය සංස්ථාවලට අදාළ දීමනා ගෙවනු ලැබේ.

**වයස :**

අවුරුදු 22 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපානු ඇත.

## ප්‍රධාන විධායක නිලධාරී / සාමාන්‍යාධිකාරී තනතුර - 01

**සුදුසුකම් :**

### බාහිර :

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විද්‍යා / කෘෂිකර්ම / ව්‍යාපාර පරිපාලන හෝ වෙනත් ඕනෑම අදාළ ක්ෂේත්‍රයක ප්‍රථම උපාධියක් සහ විද්‍යා / කෘෂිකර්ම / ව්‍යාපාර පරිපාලන හෝ වෙනත් ඕනෑම අදාළ ක්ෂේත්‍රයක පශ්චාත් උපාධියක් හෝ පිළිගත් වෘත්තීය ආයතනයක කළමනාකරණ ක්ෂේත්‍රයේ ආයතනයක සාමාජිකත්වය.

   **සහ**

   ප්‍රථම උපාධිය ලබාගැනීමෙන් පසු, සංස්ථාවක, මණ්ඩලයක හෝ ප්‍රසිද්ධ වෙළඳ ආයතනයක සනාථකළ සේවා වාර්තාවක් සමග ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තලයේ වසර 05 ඇතුළත්ව, කළමනාකරණ තලයේ අවම වසර 20 ක පළපුරුද්ද

   **හෝ**

02. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විද්‍යා / කෘෂිකර්ම / ව්‍යාපාර පරිපාලන හෝ වෙනත් අදාළ ක්ෂේත්‍රයක ප්‍රථම උපාධියක්

   **සහ**

   විද්‍යා / කෘෂිකර්ම / ව්‍යාපාර පරිපාලන හෝ වෙනත් ඕනෑම අදාළ ක්ෂේත්‍රයක PhD උපාධියක්, **සහ**

   ප්‍රථම උපාධිය ලබාගැනීමෙන් පසු සංස්ථාවක, මණ්ඩලයක හෝ ප්‍රසිද්ධ වෙළඳ ආයතනයක සනාථ කළ සේවා වාර්තාවක් සමග අවම වශයෙන්, ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තලයේ වසර 05 ක පළපුරුද්ද

### අභ්‍යන්තර :

තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ ජ්‍යෙෂ්ඨ කළමනාකරු වර්ගීකරණයේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවාවක් සහ බහුකාර්ය කණ්ඩායම් මෙහෙයවීමේ හා දිශානති කිරීමේ සනාථ කළ හැකියාව මානව හා වෙනත් සම්පත් නිසි ලෙස සේවයේ යෙදවීමේ හා කාර්යක්ෂම කළමනාකරණයේ පළපුරුද්ද.

**වැටුප් හා වෙනත් දීමනා :**

**වැටුප :** දෙපාර්තමේන්තු කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 ප්‍රකාරව වේ.

HM 2-1 - රුපියල් [93,020 - 12,x2,700 - 125,420]

**වෙනත් දීමනා :**

(ප්‍රවාහන දීමනාව රුපියල් 50,000/- වන අතර, රජයේ චක්‍රලේඛ ප්‍රකාරව තනතුරට අදාළ මාසික ඉන්ධන දීමනාව සමග මාසික දුරකථන වියදම් ප්‍රතිපූර්ණ ගෙවීම් ලෙස රුපියල් 9,000/- ගෙවනු ලැබේ)

**වයස :**

අවුරුදු 35 ට නොඅඩු විය යුතු අතර, 55 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්හට මෙම ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

**පත්කිරීමේ ස්වභාවය :**

තනතුර ස්ථිර වන අතර, සේවක අර්ථසාධක අරමුදලට හා සේවක භාර අරමුදලට හිමිකම ඇත.

## නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය) (කොන්ත්‍රාත් පදනමින්) තනතුරු - 01

**සුදුසුකම් :**

### බාහිර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මූල්‍ය කළමනාකරණ, ගණකාධිකරණ හෝ ආර්ථික විද්‍යා හෝ වාණිජ්‍ය විෂය ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක්

   **සමග**

   අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි (මාස්ටර්ස්) සුදුසුකම් හෝ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ ආශ්‍රිත සාමාජිකත්වය

   **සහ**

   සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ ප්‍රසිද්ධ පෞද්ගලික ආයතනයක, මූල්‍ය ක්ෂේත්‍රයේ, "**කළමනාකරණ තලයේ**" අවම වශයෙන් වසර 15 ක පළපුරුද්ද,

02. තනතුරට අදාළ ක්ෂේත්‍රයක පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක පූර්ණ සාමාජිකත්වය.

   **සහ**

   සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ ප්‍රසිද්ධ මූල්‍ය ක්ෂේත්‍රයේ පුද්ගලික ආයතනයක "**කළමනාකරණ තලයේ**" අවම වශයෙන් වසර 15 ක පළපුරුද්ද.

### අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)

01. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන්හට අදාළ සුදුසුකම් ලබා තිබීම.
02. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ කළමනාකරු වර්ගීකරණයේ (MM 1-1) I ශ්‍රේණිය තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කිරීම.

**වැටුප් හා අනෙකුත් දීමනා :**

**වැටුප් :** දෙපාර්තමේන්තු කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 ප්‍රකාරව ගෙවනු ලැබේ.

HM 1-1 - 2016 - රුපියල් 81,670 - 15x2,270 - 115,720

**වෙනත් දීමනා :**

(ප්‍රවාහන දීමනාව රුපියල් 50,000/- වන අතර, රජයේ චක්‍රලේඛ ප්‍රකාරව තනතුරට අදාළ මාසික ඉන්ධන දීමනාව සමග මාසික දුරකථන වියදම් ප්‍රතිපූර්ණ ගෙවීම් ලෙස රුපියල් 9,000/- ගෙවනු ලැබේ)

**වයස :**

අවුරුදු 35 ට නොඅඩු විය යුතු අතර, 55 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්හට මෙම ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

**පත්කිරීමේ ස්වභාවය :**

බඳවාගැනීම, එක් වසරක් සඳහා කොන්ත්‍රාත් පදනමින් සිදුකරනු ලබන අතර, තවත් වසරක් දීර්ඝ කිරීම, කාර්ය සාධනය මත සිදුකරනු ලැබේ..

## ප්‍රධාන අභ්‍යන්තර විගණක (කොන්ත්‍රාත් පදනම) - තනතුරු - 01

**සුදුසුකම් :**

### බාහිර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මූල්‍ය කළමනාකරණ, ගණකාධිකාරී හෝ ආර්ථික විද්‍යා හෝ වාණිජ්‍ය ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක්,

   **සමග**

   අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි (මාස්ටර්ස්) සුදුසුකම් හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය

   **සහ**

   අභ්‍යන්තර විගණන ක්ෂේත්‍රයේ, සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ ප්‍රසිද්ධ පෞද්ගලික ආයතනයක, "**කළමනාකරණ තලයේ**" අවම වශයෙන් වසර 15 ක පළපුරුද්ද.

02. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක පූර්ණ සාමාජිකත්වය

   **සහ**

   සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ ප්‍රසිද්ධ පෞද්ගලික ආයතනයක, "**කළමනාකරණ තලයේ**" අදාළ අභ්‍යන්තර විගණන ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 15 ක පළපුරුද්ද.

### අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)

01. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන්හට අදාළ සුදුසුකම් ලබා තිබීම.
02. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ කළමනාකරු වර්ගීකරණයේ (MM 1-1) I ශ්‍රේණිය තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කිරීම.

**වැටුප් හා වෙනත් දීමනා :**

**වැටුප් :** දෙපාර්තමේන්තු කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 ප්‍රකාරව ගෙවනු ලැබේ.

HM 1-1 - 2016 - රුපියල් 81,670 - 15x2,270 - 115,270/-

**වෙනත් දීමනා :**

(ප්‍රවාහන දීමනාව රුපියල් 50,000/- වන අතර, රජයේ චක්‍රලේඛ ප්‍රකාරව මාසික ඉන්ධන දීමනාව සමග මාසික දුරකථන වියදම් ප්‍රතිපූර්ණ ගෙවීම් ලෙස රුපියල් 9,000/- ගෙවනු ලැබේ)

**වයස :**

අවුරුදු 35 ට නොඅඩු විය යුතු අතර, 55 ට නොවැඩි විය යුතුය. මෙම ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්හට අදාළ නොවේ.

**පත්කිරීමේ ස්වභාවය :**

පත්කිරීම, කොන්ත්‍රාත් පදනමින් එක් වසරක් සඳහා වන අතර, තවත් වසරක් දීර්ඝ කිරීම, කාර්ය සාධනය මත පදනම්ව සලකා බලනු ලැබේ.

**සෑම අයදුම්කරුවකුම**

01. ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.
02. තනතුරට අදාළ රාජකාරී නිසියාකාරව ඉටු කිරීම සඳහාත්, දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හැකිවන අයුරුත් ඉහළ ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.
03. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

ඉහතින් දක්වා ඇති සුදුසුකම් හා පළපුරුද්ද ඔබ සතුව පවතී නම්, ජීව දත්ත හා අදාළ සහතිකවල පිටපත් සහිතව වූ ඔබගේ අයදුම්පත්, ලියාපදිංචි තැපෑලෙන්, මෙම දැන්වීම පළවී දින 14 ක් ඇතුළත පහත සඳහන් ලිපිනය වෙත ලැබීමට සැලැස්විය යුතුය. (අයදුම්කරනු ලබන තනතුර අදාළ කවරයේ වම් ඉහළ කෙළවරේ සඳහන් කළ යුතුය)

(කෙටි ලැයිස්තුගත අයදුම්කරුවන් සමග පමණක්, ආයතනය විසින් ලිපි ගනුදෙනු කරනු ලැබේ)

**සභාපති,**
**සමුපකාර තොග වෙළඳ සංස්ථාව,**
**27, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.**